කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

බෞද්ධ දර්ශනය

මූලාශ්‍රය අධ්‍යයනය හා ආදී බෞද්ධ නිකාය - **BUPH E - 1025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්ණ සංඛ්‍යාව 10 යි. කාලය පැය : 03

---

01 ශීල ප්‍රතිපදාව චූල, මධ්‍ය, මහාශීල වශයෙන් විවරණය කොට ඇති අයුරු බ්‍රහ්මජාල සූත්‍රයට අනුව පැහැදිලි කරන්න.

හෝ

මක්ඛලීගෝසාලගේ ඉගැන්වීම් මූලාශ්‍රයට අනුව ගෙනහැර දක්වා, ඒ පිළිබඳ බෞද්ධ විවරණය ගෙනහැර දක්වන්න.

02 ආර්යමාර්ගය ගිහි - පැවිදි දෙපක්ෂයේම අභිමතාර්ථ සපුරාලන ප්‍රතිපදාවක්වන අයුරු අදාළ මූලාශ්‍රයානුසාරයෙන් විශද කරන්න.

හෝ

සන්තානගත හා සමාජගත දුක පටිච්චසමුප්පන්නව ප්‍රභවය වන අයුරු නියමිත මූලාශ්‍රය මගින් ප්‍රකට කරන්න.

03 ද්වාදශාංග පටිච්චසමුප්පාදයේ එක් එක් අංගයට අභිසමය සංයුක්තාගත නිර්වචන සපයන්න.

04 ඉන්ද්‍රිය විඥ්ඤාණයේ ප්‍රභවය දුකට ප්‍රත්‍යය වන අයුරු මධුපිණ්ඩික සූත්‍රය ඇසුරෙන් විස්තර කරන්න.

05 බෞද්ධ සංඝ සමාජය නිකාය වශයෙන් බෙදී යාමට තුඩුදුන් හේතු සාධක බුදුරජුන් ජීවමාන කාලයේ සිටම වර්ධනය වෙමින් පැවතියේදැයි පරීක්ෂා කරන්න.

06 මහාසාංඝික සම්ප්‍රදායයේ උදාව පිණිස පාදකවීයයි සැලකිය හැකි මූලබීජ මූලික සූත්‍ර දේශනා තුළ ඇතුළත්වී ඇත්දැයි ගවේෂණය කරන්න.

07 "ථෙරවාද" යන්න මූලාශ්‍රය ඇසුරෙන් නිර්වචනය කොට තත් සම්ප්‍රදාය විකාශයට පත්වූ අයුරු පැහැදිලි කරන්න.

08 සර්වාස්තිවාදයේ උදාව පිණිස බලපෑ හේතු පරීක්ෂා කොට, එකී සම්ප්‍රදායට අයත් මූලික ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.

09 පුද්ගලවාදය තහවුරු කිරීමෙහිලා තත් නිකායිකයන් මූලික සූත්‍ර දේශනාවලින්ම සාධක ගෙනහැර දක්වා ඇති අයුරු පෙන්වා දෙන්න.

10 පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට ප්‍රමාණවත් විවරණ සපයන්න.

I සෞත්‍රාන්තික සම්ප්‍රදාය

ii විසුද්ධිමග්ග

iii දෙවන ධර්ම සංගායනාව

iv දුක්ඛාර්ය සත්‍යය

***********************************